කලාපය 1

2024


# Cyber Guardian

Publication for your online safety

## RANSOMWARE කප්පම් මෘදුකාංග පිටුදැකීමේ ජාත්‍යන්තර වැඩසටහන සමග ශ්‍රී ලංකාව සම්බන්ධවේ


රැන්සම්වෙයා කප්පම් මෘදුකාංග පිටුදැකීම පිණිස ජාත්‍යන්තර සම්බන්ධිකරණය සඳහා ඇමෙරික එක්සත් ජනපදය විසින් රටවල් ගණනාවක් සමග එක්ව 2021 දී පොදු වැඩසටහනක් ආරම්භ කරනලදී. මෙම කප්පම් මෘදුකාංග පිටුදැකීමේ ජාත්‍යන්තර සමාරම්භක වැඩපිළිවලට එක්වන ලෙස ශ්‍රී ලංකාවටද ආරාධනා ලැබී තිබේ.

එය පිළිගැනීම සඳහා වූ කැබිනෙට් අනුමැතිය ලැබී තිබේ. තාක්ෂණ අමාත්‍යවරයා ලෙස ජනාධිපතිතුමා සහ අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවසතා ප්‍රතිසංස්කරණ අමාත්‍ය වරයා එකාබද්ධව මෙම යෝජනාව කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරිණ. ලෝව පුරා රටවල් 48 ක්, යුරෝපා සන්ගමය මෙන්ම ජාත්ත්‍යන්තර පොලිසියද ඊට එක්ව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මෑතකාලයේ සිට රැන්සම්වෙයා අහිතකර මෘදුකාංග හේතුවෙන් ශ්‍රීලංකාවද විවිධ තර්ජනවලට මුහුණ දී සිටින බැවින් ඒවාට මුහුණ දීම සඳහා මෙම සමුළුවට එක්වීමෙන් ප්‍රතිලාබ අත්කරගත හැකිවනු ඇත.



## ඩිජිටල් අවකාශයේ ඔබගේ අනන්‍යතාවය සුරක්ෂිතද?

ඔබගේ පුද්ගලික තොරතුරු ගැන ඔබ කොතෙක් සැලකිලිමත් ද ? ඔබගෙ පුද්ගලික තොරතුරු සයිබර් අපරාධකරුවකු ලබා ගතහොත් ඔබට බොහො දෙවල් අහිමිවිය හැකියි. බැංකු ගත මුදල් සොරකම් කිරීමට හෝ වෙනත් ප්‍රතිලාබයක් ලබා ගැනීමට අපරාධ කරුවන්ට ඉන් අවස්තාව ලැබේ. ඔබේ නමින් ව්‍යාජ හැදුනුම් පතක් ලබා  ගැනීම, ණය ලබා ගැනීම් සහ වෙනත් මුල්‍ය ප්‍රතිලාභ ගැනීමට හෝ ඔබේ නමින් වෙනත් කෙනෙකුගේ ඡායාරුප සහිතව හැදුනුම්පත් සදහා ඉල්ලුම් කල හැකියි. මෙය ඔබට විශාල මානසික පීඩනයක් ගෙන දෙන්නක් පමණක් නොව එය යතාවත් කරගැනීමට බොහෝ කාලයක්



වෙහෙස වන්නට සිදුවනු ඇත. ඔබගේ අනන්‍යතාවය තවත් කෙනෙකු සොරකම් කර ඇත්දැයි ඔබ දන්නේ කෙසේද? ඔබගේ බැංකු ප්‍රාකාශණවල ඔබ සිදු නොකළ මිලදී ගැනීම් හෝ මුදල් ආපසු ගැනීම් දැකගත හැකිවීම. ඔබට එදිනෙදා ලැබෙන විදුලි බිල්පත් වැනි තැපැල් නොලැබීයාම. ඔබ මිලදී ගෙන නැති දේවල් සඳහා බිල්පත් හෝ රිසිට්පත් හෝ ඔබ ඉල්ලුම් නොකළ ණය හෝ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වූ ප්‍රකාශ ලැබීම ඔබ කිසිදා ඉල්ලුම් නොකළ රජයේ ප්‍රතිලාභයක් ඔබට ලැබෙන බව රජයේ ආයතනයකින් දැනුම් දීම ඔබ නොගත් ණය හේතුවෙන් අසා දුගතවී ඔබ ඉල්ලුම්කරන ණය ප්‍රතික්ෂේපවීම වැනි සිදුවීම් ඔබගේ පුගලික දත්ත සොරකම් කර ඇති බවට ඉගි සපයයි.

### ඔබ සහ ඔබේ පවුල ආරක්ෂා කර ගන්නේ කෙසේද

**ඔබේ පෞද්ගලික තොරතුරු සහ දත්ත අන්යයන් සමග බෙදා ගැනීම සීමා කරන්න ඔබේ උපන්දිනය ඔබේ ලිපිනය ඇතුළත් නව නිවසක ඡායාරෑප හෝ ඔබේ දරුවන්ගේ පාසල හඳුනා ගන්නා ඡායාරෑප හෝ ඔබ ගිය පාසල්වල තොරතුරු වැනි සමාජ මාධ්‍යවල තොරතුරු බෙදා ගැනීම ගැන නැවත සලකා බලන්න.**

**මෙම විස්තර බොහෝ විට මුල්‍ය සහ අනෙකුත් වැදගත් ගිණුම් වල ආරක්ෂක ප්‍රශ්න ලෙස භාවිතා වේ. ඔබේ සමාජ මාධ්‍ය රහසෲතා  සැකසීම් පුද්ගලික ලෙස සකසන්න. ඔබ ඔබේ ඡායාරෑප සහ පළකිරීම් බෙදා ගන්නේ ඔබ දන්නා සහ විශ්වාස කරන පුද්ගලයන් සමඟ පමණක් බව සහතික කර ගන්න. නාඳුනන අයගෙන් මිතුරු ඉල්ලීම් පිළිගැ නීමෙන් වලකින්න.**

**සයිබර් අපරා ධකරුවන් ඔබව රවටා  ඔබගේ පුද්ගලික තො රතුරු ලබා ගැනීමට  උත්සාහ දැරිය හැකිය. ඔවුන් පිළිගත් ආයතන ලෙස පෙනී සිටිමින් ව්යාජ කෙටි පණිවිඩ හෝ ව්යාජ වෙබ් අඩවි හරහා  ඔබේ සංවේදී තොරතුරු සොරකම් කිරීමට ඉඩ ඇත.**

මෙවැනි ව්‍යාජ සිදුවීම් වැඩිවෙමින් පවතින නිසා බොහෝ සමාගම් දැන් මෙවැනි යාවත්කාලින කිරීම් ඉල්ලා සිටීම නවතා ඇති බව සිහිතබා ගන්න.

# දකුණු ආසියානු කලාපීය සයිබර් ආරක්ෂණ සමුළුව ශ්‍රීලංකාවේදී

මෙවර දකුණු ආසියානු කලාපීය සයිබර් ආරක්ෂණ සමුළුවී පසුගියදා කොළඹ දී පැවැත්විණ. ශ්‍රීලංකා සර්ට් ආයතනය හා CLDP වැඩසටහන සමග එක්ව මෙම සමුළුව සංවිධානය කෙරින. කලාපය තුළ සයිබර් ආරක්ෂණ සහයෝගීතාව වර්ධන කිරීම මෙහි අරමුනයි.

මාලදිවයින බංගලිදේශය නේපාලය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වැනි රටවල සහභාගීත්වයෙන් පවතී මෙම සමුළුව සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සාමූහිකව එක්වියයුතු අවශ්‍ය අංශ හඳුනා ගැනීම සඳහා ඉහළ මට්ටමේ වේදිකාවක් ලෙස කටයුතු කරයි.

කලාපිය වශයෙන් මුහුණදෙන සයිබර් ආරක්ෂණ අභියෝගවලට විසඳුම්සෙවීම සඳහා රාජ්‍ය නිලධාරින් කර්මාන්තයේ නියුක්තවුවන් සහ විද්වතුන් ඇතුළු කලාපීය පාර්ශවකරුවන් අතර සංවාදයට සහ සහයෝගීතාවයට මෙමගින් අවස්තාව උදාවිය.

සයිබර් තර්ජන පිලිබඳ අත්දැකීම් බෙදාගැනීම ධාරිතාව සංවර්ධනය සිදුවීම් ප්‍රතිචාර සහ ප්‍රතිපත්ති සංවර්ධනය වැනි විවිධ සයිබර් ආරක්ෂණ මාතෘකා පිළිබඳ මෙහිදී සාකචාකෙරින.

අන්තර්ක්‍රියාකාරී සැසි සහ වැඩමුළු මගින් සහභාගිවන්නනන්ට හොඳම භාවිතයන් පිලිබඳ දැනුම හුවමාරු කර ගැනීමටසහ සහයෝගයෙන් වැඩකලයුතු ක්ෂේශ්ත්‍ර ගවේෂණය කිරීමට මෙහිදී අවශතාව ලැබුණි.

කලාපීය හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සහ සයිබර් ආරක්ෂාව සඳහා සාමූහික ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මගින්කලාපිය රටවල පුළුල් ආරක්ෂිත ඩිජිටල් පරිසරයක් සඳහා දායක වීමට මෙවැනි සමුළු උපකාරිවේ.



# සෞඛ්‍ය අංශයේ සයිබර් ආරක්ෂකයින් බලගැන්වේ




සයිබර් ආරක්ෂාව පිලිබඳ සෞඛ්‍ය අංශයේ නිලධාරින් දැනුවත්කිරීමේ වැඩමුළුවක් පසුගියදා පැවැත්විණ. ශ්‍රීලංකා සර්ට් ආයතනය විසින් මෙය සංවිධානය කරනලදී.

සෞඛ්‍ය සේවයේ පරිවර්තනිය වෙනසක් ඩිජිටල් තාක්ෂනය මගින් ඇතිකර ඇති යුගයක ශක්තිමත් සයිබර් ආරක්ෂණ ක්‍රමවේදයන්  සහතික කිරීම මෙමගින්  අපේක්ෂා කෙරේ. ඩිජිටල් පරිවර්තනයක් සදහා අවශ්‍ය මෙවලම් සහ දැනුමෙන් සෞඛ්‍ය සේවා සපයන්නන් සවිබල ගැන්වීමෙන රෝගීන්ගේ දත්ත ආරක්ෂා කිරීම පමණක් නොව ඔවුන්ගේ විශ්වාසය සහ රහෂ්‍ය භාවයද ආරක්ෂා කරගැනීමට හැකිවනු ඇත.

සෑම කෙනෙකුටම සයිබර් ආරක්ෂාව පිළිබඳ විශේෂඥ දැනුමක් නොතිබුණද තීරණාත්මක දත්තවල ආරක්ෂාව සහ රහෂ්‍ය භාවය පවත්වාගෙන යාමේදී ඔවුන්ගේ භූමිකාවන් ඉතා වැදගත් වේ. මෙම පුහුණුවෙන් සයිබර් ආරක්ෂණ තීක්ෂ්ණ බුද්ධිය සැපයීම රාජ්‍ය ආයතන තුළ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සෞඛ්‍ය සේවා අංශය තුළ ඔවුන්ගේ නිශ්චිත වගකීම්වලට අනුව සකස් කරන ලද හොඳම භාවිතයන් කෙරෙහි අවධානය යොමු කර ඇත.

වෛද්‍යාවරුන්ගේ සිට හෙදියන් දක්වා සහ දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් කේන්ද්‍රස්ථානය වන මෙම විවිධ කණ්ඩායම් රට පුරා සෞඛ්‍ය සේවාවල කොඳු නාරටිය නියෝජනය කරයි. සෞඛ්‍ය සේවා අංශය තුළ සයිබර් ආරක්ෂණ භාවිතයන් වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී නියැලීම සහ කැපවීම මෙහිදී දැකගත හැකිවිය.




# අනාරක්ෂිත ජාල භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිය

රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල සිය කටයුතු සදහා විද්‍යුත් තැපැල් ගිණුම් වලට හෝ අනෙකුත් කාර්යාලිය තොරතුරු තාක්ෂන මෘදුකාංග වෙතප්‍රවේස වීම සදහා විශ්වාසදයි නොවන සහ අනාරක්ෂිත වයි ෆයි ජාල (උදා අපනසාලා හෝටල් පොදු බස්නැවතුම් පොළවළ ඇති ස්ථානගත ) හෝ පොදුවේ පරිහරණය කරන පරිගණක පොදු අන්තර්ජාල වේවා  සපයන මධ්‍යස්ථාන සහ වෙනත් එවැනි මෙවලම් භාවිතයෙන් වැළකිය යුතුවේ.

මෙම ප්‍රතිපත්තිය සියලුම රාජ්‍ය ආයතන සදහා  අදාලවේ.